# ව/නෙඩුන්කුලම විදුහල
# V/ Nedunkulama Viduhala

2023.01.12

චන්ද්‍රා ප්‍රනාන්දු මහතා

නිර්මාතෘ,

අඳුරෙන් එළියට සත්කාරක වැඩසටහන,

**තුති පුද කිරීම**

වවුනියාව දිස්ත්‍රික්කයේ අති දුෂ්කර පාසලක් වන මාගේ පාසල හා තවත් දුෂ්කර පාසල් හතරක සුවහසක් ආර්ථික අපහසුතා මධ්‍යයේ දිවිගෙවමින් සාර්ථකව අකුරු කරන දු දරුවන්ගේ දෑස් පහදා දීමට හා ඔවුන්ගේ දෙමාවුපියන්ගේ අත්‍යාවශ්‍ය කටයුතු වෙනුවෙන් විදුලි පහන් ආලෝකය ලබා දීම සඳහා සූර්ය විදුලි කෝෂ කට්ටල

| | |
|---|---|
| ව/නෙඩුන්කුලම ර.සි.මි.වි. | 20 |
| ව/අග්‍රබෝධි මහ විද්‍යාලය | 16 |
| ව/මඩුකන්ද ජාතික පාසල | 17 |
| ව/ගාමිණී ජාතික පාසල | 15 |
| ව/ශ්‍රී ධම්මරතන විද්‍යායතන පිරිවෙන | 07 |
| | 75 |

වශයෙන් ලබා දීමේ කර්තව්‍ය සාර්ථකව සිදු කළෙමු. ඒ තුළින් පාසල්වල දූ දරුවන් හා දෙමාවුපියන්ගේ බලාපොරොත්තු මැනවින් සාර්ථක කර ගනී යැයි අපේ විශ්වාසයයි.

ඒ අනුව "අඳුරෙන් එළියට" සත්කාරක වැඩසටහන යටතේ ඔබතුමා හා ඔබ මැතිණියගේ ප්‍රධානත්වයෙන් ඕස්ට්‍රේලියාවේ මෙල්බන් නුවර පදිංචි සිරිමෙව්යන් විසින් පරිත්‍යාග කරන ලද සූර්ය විදුලි කෝෂ කට්ටල 75 අපගේ දූ දරුවන්ට හා දෙමාවුපියන්ට අගනා වස්තුවක් බව ඔවුන් පැවසූ වදන්වලින් අප හට මැනවින් පසක් විය. මෙවැනි අසරණ වූ දරුවන් වෙනුවෙන් ඔවුන්ගේ ජීවිතයේ වැදගත් වන අවශ්‍යතාවයන් පිළිබඳ ඉතා ඕනකමින් සොයා බලා ඒ වෙනුවෙන් ඔබතුමන්ලාගේ කාලය, ශ්‍රමය වැය කරමින් කැප කළ අපරිමිත වෙහෙස, මහන්සිය අපි ඉතා ගෞරවයෙන් යුතුව සිහිපත් කරන අතර, මෙම දරුවන් මේ තුළින් ලබන ආලෝකය සේම ඔබගේත්, ඔබමැතිණිය ඇතුළු පවුලේ සියලු දෙනාගේත් සහය වූ සැමගේත් නිරෝගීමත් දිවි කල එළි පහන් වේවා යැයි සියලු දුවා දරුවන් වෙනුවෙන් ප්‍රාර්ථනා කරමී. දැයේ දරුවන් වෙනුවෙන් එසේ වෙහෙස මහන්සිය නොතකා කැපවීම සම්බන්ධයෙන් සියලු පාසල්වල විදුහල්පතිවරු, ගුරු මණ්ඩලය, දූ දරුවන් හා දෙමාවුපියන් වෙනුවෙන් ඔබ සැමට මාගේ ගෞරවණීය ස්තූතිය පුද කරන අතර, මෙවැනි සත්කාරයන් තව දුරටත් ඉටු කිරීමට ශක්තිය ධෛර්ය හා නිරෝගී සම්පත ලැබේවා කියා මා ප්‍රාර්ථනා කරමී.

.................................

විදුහල්පති අත්සන

S.M.I.N.Wimaladasa
Principal
V/Nedunkulama G.S.M.S.
Vavuniya.